# එතෙරවීම

## අතුල විජේවික්‍රම

සීතල අමාවක රැයක
ඕ තොමෝ තොටුපලට පැමිණා
නැගී පොඩි ඔරුවක තනිවම
හබල් ගසමින් ගියා මුළු රැයම
බලමින් ගමන් මග
එළිය දෙන සැර අකුණු පහරට

උදෑසන එන කොටම
දැක ඈත දූපතක සලකුණක්
ගත වාරු නැති වුනත්
හිත වාරු කරගෙන
පදවගෙන ගියා ඒ නුහුරු බිම දෙසට

දිව ගියා ඒ දූපතට අතැර
දමා ඔරු කඳ ඉවුර ගග අසල

ඉක්බිතිව,
අත්දෙකින් බදාගෙන සිටින ඒ හබල දැක
වාරුගෙන අත්දෙකට පද්දමින්
වීසිකරලා දැම්ම ඈත ගඟ දියඹට
කොහේ හෝ ගසා ගෙන යන්නට

බලාසිටියා හබල පාවෙලා යන අයුරු
නෙත් දෙකට නොපෙනෙනා තුරුවම

# ජලගැල්ම

## මංගලිකා ප්‍රනාන්දු

**ලින්බෘක්**

නිසරු බිමක් සරු කරන්න
තෙතමනයක් ඇවැසි විටෙක
ඩිංග ඩිංග නුඹ වැටෙන්න
වියළි මෙබිම පණ නගන්න

හීයක් මෙන් සැර වැහි බිඳු
ගිගුම් දිදී වා තලයම
ඇයිද ගඟේ මේ වේගය
උඩගුවෙන්ද විරසකවද?

වේග ගමන් නුඹ යන විට
ගලනා මහ බොර ජල කඳී
ගං දෑලේ විසිතුරු මල්
හෙළා බිමට ඇයි තරහින්?

පොලොව වෙලා ගෙන දියතම
ගැහැට විපත් නෙක අතවර
අහිමි කරන් මුලු සේසත
උසුලණු නොහැකිය දුක කඳ

# ජීවිත කතාවක අරුමය.

දිවි ගඟ මුවදොරේ විශ්‍රාමිකව     අද
පසු වෙමි ඇස් ඉදිරියේ මරණයෙ     මුහුද
සිටිනා විටෙක මෙහොතක් මතකයෙ     කිවිද
සතුටක් ලබමි ගලපා පෙර දිනට     අද

උපතින් හිමි වුනේ මට ගැමි     පරිසරය
තාත්තගෙ රැකියාව සඳහට     ගොවිතැනය
දරුන් මගේ ඉපදුනෙ කොළඹ     හතදීය
මම දැන් ලංකා බැංකුවේ     විශ්‍රාමිකය

සැතපුම් දෙකකි දුර ගම ඇති     පාසැලට
වැසිදා පා ගමන හබරල පිත්ත     යට
ළමයින් උදේ පාසැලන වෙත ඇර     ලන්ට
පාසැල් වෑන් රිය එනවා     දොරකොඩට

හතරයි එකයි ප්‍රතිඵල මගේ උසස්     පෙළින්
එනමුත් තිබුනෙ නැහැ සරසවි යන්න     වරම්
දැනුණා හිතට දුක වාවනු නොහැකි     ලෙසින්
දිවි මග වෙනස් කෙරුනා ඉරණමේ     බලෙන්

ඉරණම අනුව මම අගනුවරටම     වුනා
දරු දෙන්නෙකුට ආදරබර පියෙකු     වුනා
දෙන්නම උපාධි ලෝගුව ජය     ලැබුනා
මගෙ හිත තිබූ සරසවි දුක ඉන්     නිවුනා

යුග දිවි ඇරඹුවේ මගෙ මහිතු     මනාපෙටයි
සාදය පැවතුනේ චාමෙට     ගෙදරදීමයි
එතැනින් ඇරඹුනේ අපගේ දිවි     සටනයි
දරුවන් ගැන සිතෙන විට අද සිත     සතුටුයි

දරුවන්ගේ විවාහය අතපසු     වීමෙන්
සමහර දෙමව්පියෝ දුක විඳිනව     මනසින්
මට නැහැ ගැටළුවක් වුනෙ එය කිසි     ලෙසකින්
දෙන්නට දෙන්න ගැලපෙන ලෙස තිබුණි     සොයන්

දරුවන්ගේ පැතුම් ඉටුවන අද     දවසේ
දෙන්නම හොඳින් ඉන්නව කැන්ගරු     දේසේ
දරුමුණුබුරන් සමගින් එම සන්     තෝසේ
ජීවිත කතාවක අරුමය දකිමි     මෙසේ

## ජයසේන කොඩිතුවක්කු

නො. 75, කිං ලේක් ඩ්‍රයිව්
මැනෝ ලේක්.

# මව්බිමට යාමට පෙරාතුව

තරු කැට වගේ මා අසලම සිටින     දරුන්
දමා යන්නේ හද කකියන බෝ     දුකකින්
දහසක් ප්‍රශ්න ඇත හද තුල කැකෑ     රෙමින්
විසඳිය යුතුය ඒකයි යනුයේ     සැනෙකින්

දෙවෙනි කරුණ මගේ ලෙඩ දුක     බලවන්න
වෙදැදුරු හමුව ඒවා විසඳා     ලන්න
මෙහෙදී ඩොලර් කොල ඕනැනෙ     යහමින්න
මම අකමැතියි දරුනට කරදර     දෙන්න

මම එනතුරා දරුවනි මගෙ පණට     සම
සැමදා සිටිය ලෙස සමගිව සිටිනු     පෙම
ආරවුල් එපා කරනට කිසි දිනෙක     හෙම
සිටිනුය එකාමෙන් දරුවෙනි දිනක     හැම

මෙතුවක් කලක් පණමෙන් මා රැකි     පිනට
බුදු බව ලැබෙනවා දරුවෙනි ඔබ     සැමට
නිරෝගී සුවය දිගු ආයුෂ     සැමට
ලැබ තෙරුවණේ සරණය වේවා!     සැමට

## දයා මානෙල් සෙනෙවිරත්න

සමස්ත ලංකා කවි සම්මේලනය
සහ අ.ත.ක.ස.හි.




# යායුතු මග වෙහෙසයි ......

ජීවිතයේ කඳු පාමුල
අපි සමනළ දවස ගෙවන්නේ
බාධක කම්කටොලු මැදින්
අනාගතයෙ සිහින දකින්නේ
යායුතු මග වෙහෙසයි
දරායුතු දේ බොහොමයි ....

අපේ කමට අපේ බසට
ආදරයයි හිත කොඳුරන්නේ
ගමන් මගේ බෙදී බැඳුගෙන
ඒ සෙනෙහස එකතු කරන්නේ
යායුතු මග වෙහෙසයි
දරායුතු දේ බොහොමයි ....

බලාපොරොත්තුවෙ හිරුඑළිය
සිහින දිගේ පාර කියන්නේ
උත්සාහය දිනුම දිගේ
එකමුතුකම පවුරු බඳින්නේ
යායුතු මග වෙහෙසයි
දරායුතු දේ බොහොමයි ...

අතුල කල්දෙමුල්ල සිඩ්නි

# නිවසේ සුරතලිය

## දයා විජේසූරිය

**බෙරිත් - මෙල්බර්න්**

කෝබී නමින්     යුත්
සුදු සුරතලිය     නැණවත්
ඇගෙ දිවිය     යහපත්
ලබාදෙයි නිවසට     සොම්නස්

අපෙ නිවසනේ වෙසෙනා සුදු     සුරතලිය
කෝබී ඇගෙ නමයි අප පවසන     විදිය
නිතරම අපි ලඟයි ඇග ජීවන     නදිය
ගලනා හැටි කියන්නට අකුරුත්     මදිය

ඇග කාලය අප ලඟමයි ගත     වන්නේ
හද පිරි සතුට අප හැමටම ගෙන     දෙන්නේ
ඇගෙ පිරිමැදීමයි නිතරම     ඉල්ලන්නේ
ඒ ඇරයුමට අපගේ සිත්     පෙළඹෙන්නේ

සුදු පැහැති ලොම් වලින් මුළු සිරුර වැසී     ඇත
මන බඳින පා සතර ලොම් වලින් පිරී     ඇත
කෙටි පාද සතරකින් දුවන විට ඇගේ     ගත
හරි අගෙයි බලන්නට සිනාසී ඇගේ     වත

නෙත් දෙක වසාගෙන සුව යහනකට     වෙලා
නිවසේ සිටින අය මොනවද කරනු     බලා
ඒ ගැන තම සිහිය හොඳ හැටි     විමසාලා
කළ යුතු මෙහෙය තේරුම් ගෙන ඉඳියි     බලා

දවසට දෙපාරක් කෝබී සමග     යන
සංචාරය හොඳයි සුවතාවයට     වන
මංමාවත් දිගේ යනවිට පා     ගමන
හමුවෙන යහළුවන් සමගද බැඳෙයි     මන

සසර ගමනක     යෙදෙන
අප සමග සසරෙහි     බැඳුන
නෑ කෙනෙක් යයි     සිතෙන
විටදි හදවත හඬා     වැලපෙන

මතු අත් බවෙහි මිනිසත් බව     සොඳින
අපගේ දිවිය හා එක් වී සැරි     සරන
කුසල් පුරාගෙන දිවි මග සරු     කෙරෙන
සව් සිරියෙන්ම වැජඹේ මන බැඳෙන     දන

# සෙනෙහස

ලක් දෙරනින් පිටව මෙල්බන් ආ     සොඳිනේ
දූ පුතු ඇවිත් සිටියා තොපටුපල වෙත     සොඳිනේ
අප දුටු විගස සතුටින් ඉපිලී     සොඳිනේ
මව්පිය යුවල වැලඳ ගත්තා සතුටින්     සොඳිනේ

පස් වසරක් ගෙවී පුතු වැඩිහිටිවී     තිබුනා
එම කාලයම අප මව මහලුව     හිඳිනා
පුතු වැලඳ ගත් විගසම මා සිත     පිරුනා
නෙතු අග කඳුලු බිඳුවක් නොදැනිම     වැටුනා

කලබල නොකල බව දූ සහතික     දුන්නා
කරදර කලත් පුතු එය නොතකා     උන්නා
අපගේ සතුට ගෙන දෙන්නට දිරි     දුන්නා
මේ දරු ලැබී අප පිංකල බව     දැනුනා

දූ පුතු වෙහෙසුනා අප සිව්දෙන     වෙනුවෙන්
මව්පිය යුවල තබනට සැම දා     සතුටින්
පිං ඇති නමුත් ලොව මේ සැමටම     වැඩියෙන්
මව්පිය උපස්තානය ඇත මහ     ඉහලින්

කැන්ගරු රටේ සිරි නරඹා කල්     ගෙවුනා
සැලුන් එකක් සොයමින් ඉසකේ     ඉදුනා
එම අඩුපාඩුවත් අපේ දූ ගෙන්     පිරිමැසුනා
හික්ෂු චරිත රඟපෑහැකි දැයි     සිතුනා

## ආනන්ද දිසානායක - ශ්‍රී ලංකාව.